**ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට හලාවත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ රු.100,000ක් වටිනා පරිගණක යන්ත්‍රය ගිණුම්ගත කර නොතිබුණි. | ජර්නල් සටහන් මගින් නිවැරදි කරන බව. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 වර්ෂය සඳහා ස්ථාවර තැන්පත් පොළී ආදායම රු.2,570,044ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ජර්නල් සටහන් මගින් නිවැරදි කරන බව. | - එම - |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී රු. 5,050,943ක් ගිණුම් ගත කර නොතිබුණි. | එම | - එම - |
| (ඈ) | ලිපිගොනු රාක්ක 18ක් මිලදී ගැනීම සඳහා වැයකරන ලද වටිනාකම රු.423,652ක් යන්ත්‍ර උපකරණ ගිණුම හා ලී බඩු උපකරණ ගිණුම තුළ සටහන් කිරීමෙන් දෙවරක් ගිණුම්ගත වී තිබුණි. | වැරදි නිවැරදි කර ගන්නා බව. | - එම - |
| (ඉ) | (i) මුද්දර ගාස්තු ගිණුමට ඌන මුද්දර ගාස්තු වශයෙන් ගැළපිය යුතු වටිනාකම රු.71,602,246ක් වුවත් රු.35,006,259ක් ගැළපුම් කිරීමෙන් සමාලෝචිත වර්ෂය | අඩුවෙන් ගිණුම්ගත කර ඇති රු.36,595,987ක මුද්දර ගාස්තු නිවැරදිව ගැළපීම් කරන බව. | - එම - |

| | | | |
|---|---|---|---|
| | අවසානයට මුද්දර ගාස්තු රු.36,595,987ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | | |
| (ii) | 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු වටිනාකම රු.66,195,372ක් වුවත් රු.31,091,274ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කරන බව. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම. | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|---|
| (අ) | **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| | (i) අංක126 (XXVII) උපවගන්තිය | ධීවර කාර්මිකයින් සඳහා සුභසාධන පහසුකම් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර නොතිබුණි. | ඉදිරියේදී එකී අංශය සඳහා අතුරු ව්‍යවස්ථා සකස්කර ගැනීමට කටයුතු කරන බව. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කළ යුතුය. |
| | (ii) 129(2)(ආ)(ඊ) වගන්තිය | ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු බදු කුලී, කඩ කුලී, උසාවි දඩ, මුද්දර ගාස්තු විධිමත් පරිදි ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | ප්‍රදේශීය සභාවට අයත් ලැබිය යුතු බදු කුලී සහ කඩකුලී මුදල් විධිමත් පරිදි ලබාගැනීමටත් අයකර ගැනීමට අපහසු දේපළ සම්බන්ධයෙන් බදුකරුවන් වෙත ලිපියොමු කර ඇති බවත් 2008 හා 2009 හිඟඋසාවි හා මුද්දර ගාස්තු කපා හැරීමට අනුමැතියට ඉදිරිපත් කර ඇති බව. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | | | |
| | රීති අංක 05 | මූල්‍ය හා ගබඩා ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රමාණවත් ආකාරයක අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි. | 2024 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්මට ඇතුළත් කර ඇති බව. | ප්‍රාදේශීය සභා රීති අනුව කටයුතු කළ යුතුය. |

(ඇ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| අංක 30/2016හි 3.1 වගන්තිය | වගන්තිය ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාව කළ යුතු අවස්ථා 03ක් දක්වා ඇතත් වාහන 07ක් සඳහා එසේ සිදු කර නොතිබුණි. | යාන්ත්‍රික ඉංජිනේරු තුමා දැනුවත් කර සිදු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.30,000,888ක් වූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,063,907ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කල තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 7,752 | 8,080 | 4,297 | 14,081 | 7,652 | 7,455 | 3,112 | 17,533 |
| කුලී | 7,003 | 9,834 | 9,363 | 2,014 | 7,330 | 6,288 | 5,929 | 1,700 |
| බලපත්‍ර ගාස්තු | 1,022 | 3,664 | 530 | 3,363 | 904 | 3,422 | 1,843 | 1,801 |
| වෙනත් ආදායම් | 1,043 | 13,990 | 5,995 | - | 1,596 | 4,654 | 4,654 | - |
| | 16,820 | 35,568 | 20,185 | 19,458 | 17,482 | 21,819 | 15,538 | 21,034 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් රු.12,852,083ක්, හිඟ අක්කර බදු රු.373,874ක්, හිඟ ජල බදු රු.672,116ක් සහ හිඟ කුලී රු.2,003,536ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලේඛනවලට අනුව රු.7,834,766ක් වූ උසාවි දඩ සහ රු.35,104,098ක් වූ මුද්දර ගාස්තු අයවිය යුතුව තිබුණි. | 2024.05.13 දිනට හිඟ උසාවි දඩ මුදලරු. 4,061,016ක් වන අතර මුද්දර ගාස්තු කිසිවක් මේ වන විට ලැබී නොමැති බව. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ආරච්චිකට්ටුව සතිපොළ බදුදීමේදී ඉදිරිපත් වූ එකම අයදුම්කරුට ප්‍රසම්පාදන කමිටු තීරණයට අනෙකුත් සාමාජිකයන් නොමැතිව සභාපති විසින් පමණක් අනුමැතිය ලබා දී තිබුණි. බදු ගිවිසුම අනුව වාර්ෂික වටිනාකම වන රු.4,520,000ක මුදල සමාන වාරික 10කින් වර්ෂයෙහි මුල් මාස 10 ඇතුළත ගෙවිය යුතු වුවද එසේ කර නොතිබුණි. එමෙන්ම 2023 වර්ෂයේ මුල් මාස 06 සඳහා බදුකරු විසින් ගෙවිය යුතු රු.107,201ක විදුලිබිල සභාව විසින් ගෙවා තිබුණි. | අඩුපාඩු ඉදිරියට නොවීමට වගබලා ගන්නා බවත් 2023.06.26 දිනෙන් පසු 2023.11.06 දින දක්වා කාලය තුල රු.1,195,000/- ක මුදලක් ගෙවා ඇති බවත් ගෙවිය යුතු දඩ මුදලින් රු.37,000ක් හා ගෙවිය යුතු විදුලි බිල් සඳහා රු.38,000ක මුදලක් අයකරගෙන ඇති බව. | ප්‍රසම්පාදන කමිටු වාර්තාවට සියළුම සාමාජිකයින් අත්සන යෙදිය යුතු අතර ඉතිරි මාසික කුලී නිසි පරිදි අය කිරීමට කටයුතු කළ යුතුය. එමෙන්ම ඉතිරි දඩ මුදල් හා විදුලි බිල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | (i) | පරිසර බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත 40ක් 2015 වර්ෂයේ සිට පරිසර බලපත්‍ර ලබා ගැනීම සිදු කර නොමැති අතර මේ හේතුවෙන් සභාවට රු.280,781ක ආදායමක් අහිමි වී තිබූ අතර සභාවේ නියමිත වගකීම්ද පැහැරහැර තිබුණි. | ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරන බව. | පරිසර බලපත්‍ර ලබා ගැනීම සඳහා කර්මාන්තකරුවන් යොමු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | වයඹ පළාත් පාලන කොමසාරිස් හා පාරිසරික ලේකම් විසින් අංක ව/පා/පු/ඒ/6/3.3.5/95 හා 1995 මාර්තු 25 දිනැති ලිපිය මඟින් සියළුම පළාත් පාලන ආයතනවල පරිසර සංරක්ෂණ ඒකක ප්‍රතිසංවිධානය හා ඒවා ක්‍රියාත්මක කරවීම සඳහා උපදෙස් ලබා දී තිබූ අතර එහි සඳහන් 3.2.3 පරිච්ඡේදය සඳහා 1996 පෙබරවාරි 26 දින වැඩිදුරටත් උපදෙස් ලබා දී තිබුණි. එහි I, II, III, IV ඡේද ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඒ සම්බන්ධ අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදුකරන බව. | පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 සැප්තැම්බර් 04 දින සභාව සතු ඉඩම් වෙනුවෙන් නාම පුවරු 15ක් මිලදී ගැනීම සඳහා රු.97,500ක මුදලක් වැයකර තිබුණද නාම පුවරු ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | මෙම ක්‍රියාමාර්ගය කඩිනමින් සිදු කිරීමට කටයුතු සුදානම් කර ඇති බව. | නාම පුවරු ඉඩම්වල ප්‍රදර්ශනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2013 අංක 01 දරණ ප්‍රජා මූල සංවිධාන (ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක) ස්ථාපිත කිරීමේ හා විධිමත් කිරීමේ ප්‍රඥප්තිය ප්‍රකාරව හඳුනාගන්නා ලද ප්‍රජාමූල සංවිධාන 20ක් ලියාපදිංචි කරවීමට කටයුතු කර නොතිබූ අතර ප්‍රජා මූල සංවිධානවල විවිධ අක්‍රමිකතාවයන් සහ ගැටළු අධීක්ෂණය කර නොතිබුණි. | ලියාපදිංචි කරවීමට හා ප්‍රජාමූල සංවිධානවල අධීක්ෂණය සභාව යටතේ සිදු කිරීමට පියවර ගන්නා බව. | සනීපාරක්ෂක ඒකකයේ ලියාපදිංචි කරවීම හා අධීක්ෂණය කළ යුතුය. |
| (ඇ) | පුස්තකාල 04ක් සඳහා 2023 වර්ෂයේ රු.5,992,266ක වියදමක් දරා තිබුණද පුස්තකාලවලට පැමිණෙන පාඨකයින් ඉතා අඩු ප්‍රමාණයක් බවත් ළමා, තරුණ, මහළු පාඨකයින්ගේ කියවීමේ රුචිකත්වය ඇති කිරීම සහ පාඨකයින් වැඩි පිරිසක් සාමාජික කර ගැනීම සඳහා වන ක්‍රියාමාර්ගත් ගෙන නොතිබුණි. | ඉදිරියේදී පාඨක සංඛ්‍යාවක් වර්ධනය කරගැනීම සඳහා පාඨක කුසලතා සංවර්ධනය සහ ප්‍රජා සත්කාරක වැඩසටහන් පවත්වන බව. | පාඨකයින් වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2023 දෙසැම්බර් 31 දිනට සභාවට ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.58,840,474ක් විය. | හිඟ ආදායම් රැස්කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරන බව. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.5,617,551ක් විය. | විවිධ ණයහිමි මුදලින් මේ වන විට රු.3,205,770ක් ගෙවීම් සිදුකර ඇති බවත් 03/2022 | ණයහිමියන් කඩිනමින් පියවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | චක්‍රලේඛ ප්‍රකාරව සංවර්ධන කටයුතු නවතා දැමූ බැවින් ණයහිමි කරන ලද කර්මාන්ත ඒ අනුව සිදු කිරීමට නොහැකි වූ බව. | |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 5කට වරක් වරිපනම් බදු ප්‍රතිශෝධනයක් සිදු කළ යුතු වුවත් 2015 වර්ෂයේ සිදු කරන ලද තක්සේරුව මත 2023 වර්ෂයේ ද වරිපනම් බදු අය කර තිබුණි. | තක්සේරු වාර්තාව ලද වහාම වරිපනම් බදු අයකිරීමට කටයුතු කරන බව. | තක්සේරු වාර්තාව ලබා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 වර්ෂයේ බදු දිය හැකි දේපළ 14ක් බදුදීමට නොහැකිව නිශ්කාර්යව පැවතුණි. | මෙම දේපල 2023 වර්ෂයට අදාලව අවස්ථා 04කදී ප්‍රසම්පාදනය කලද අයදුම්පත් ඉදිරිපත් නොවූ බව. | සභාවේ දේපළ වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 නිෂ්කායර් හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | දැයට කිරුළ වැඩසටහන යටතේ රු.6,920,809ක් වැයකර 2017 වර්ෂයේදී ඉදිකර තිබූ මානවේරිය ගිමන්හල 2023 වර්ෂය වන විටත් භාවිතයෙන් තොරව නිශ්කාර්යව තිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව. | රජයේ අරමුදල් වැය කර ඉදිකරන ලද භෞතික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතුය. |
| (ආ) | **විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ රු.702,350ක්ද සහා අරමුදල් යටතේ රු.294,425ක්ද වශයෙන් රු.996,775ක් වැයකර ඉදිකරන ලද කායවධර්න මධ්‍යස්ථානය කිසිඳු ප්‍රයෝජනයක් නොමැතිව නිශ්කායර්ව පැවතුණි.** | කායවර්ධන මධ්‍යස්ථානය මගින් සභාවට ලැබෙන ආදායම අඩු බැවින් හා ලැබෙන මුදලින් 50%ක මුදලක් කායවර්ධන මධ්‍යස්ථාන භාර උපදේශක නිළධාරී හට 2023 වර්ෂයට අදාල ඔහුට ගෙවිය යුතු මුදල් සඳහා දැනට ගෙවීම් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව. | ඵලදායී වෙනත් කාර්යයක යෙදවීමට කටයුතු කළ යුතුය. |

### 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට පවරන ලද ඉඩම් 21ක් වටා වැටවල් ගසා ආරක්ෂාව තහවුරු කර නොතිබූ අතර එලදාව බඳු දී ආදායම් ඉපයීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් කට්ටි මැන වැට ගසා නාම පුවරු යෙදීමට කටයුතු කරන බවත් එලදාව බඳු දී ආදායම් ඉපයීමට කටයුතු කරන බව. | ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කළ යුතු අතරම වත්කම්වලින් ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභා බල ප්‍රදේශය තුල පවරා නොගත් දේපළ 48ක් පැවැති අතර ඒ තුල සුසාන භූමි, ක්‍රීඩා පිට්ටනි, පුස්තකාල, ප්‍රජා ශාලා, ජල පොම්පාගාර හා පොදු වෙළඳපලක්ද විය. | වත්කම් පවරා ගැනීමට ඉල්ලීම් මේවන විටත් සිදු කර ඇති බව. | අදාළ දේපළවල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ඇ) | මානවේරිය ගිමන්හලේ ඉඩමේ නීත්‍යානුකූල අයිතිය ප්‍රාදේශීය ලේකම් මඟින් ලබා ගැනීමට කටයුතු කළ යුතු වුවද එසේ කර නොතිබුණි. | එම | එම |

### 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ අයවැය අනුව සභා බල ප්‍රදේශය වර්ග කිලෝ මීටර් 104ක් වූ අතර මාර්ග ප්‍රමාණය කිලෝ මීටර් 492ක් වේ. එයින් තාර දැමූ මාර්ග ප්‍රමාණය කිලෝ මීටර් 20ක්ද බොරළු කි.මී. 190.5ක්ද වෙනත් කි.මී. 281.5ක්ද වේ. ඒ අනුව ආරච්චිකට්ටුව සභා බල ප්‍රදේශයේ සම්පූර්ණ මාර්ග පද්ධතියෙන් සියයට 04ක් පමණක් තාර දැමූ මාර්ග විය. | තාර යොදා මාර්ග සංවර්ධනය කිරීමට තරම් ප්‍රමාණවත් ආදායමක් ප්‍රාදේශීය සභාව සතු නොවන බව. | රජයේ අරමුදල් කාර්යක්ෂම හා ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.6 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත තථ්‍ය සේවක සංඛ්‍යාව අනුව ද්විතියික ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු 12ක්ද අතිරික්තතා 02ක්ද ප්‍රාථමික | අනුමත සේවකයින් අප ආයතනයට අනුයුක්ත කරන තෙක් ආදේශක හා කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරන පුද්ගලයින්ගේ සේවය ලබා ගැනීමට සිදුව ඇති බව. | සභාවට අවශ්‍ය සේවක ප්‍රමාණය නිවැරදිව හඳුනාගෙන එම සේවක ප්‍රමාණය අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු 13ක් පැවතුණි. | | |
| (ආ) | පසුගිය වර්ෂවලදී සේවය හැර ගිය සේවකයින් 02 දෙනෙකුගෙන් රු.122,500ක ශේෂයක් අයවිය යුතුව තිබුණි. | රු.2,250.00ක් අයකර ගෙන ඇති අතර රු.120,250ක් අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගෙන ඇති බව. | අයවිය යුතු සේවක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.7 වාහන පද්ධති කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු ට්‍රේලර් 02ක් හා ට්‍රැක්ටරයක් අපහරණය කිරීම සඳහා 2022 ඔක්තෝබර් 06 දින පැවැත්වූ මහා සභා රැස්වීමේදී තීරණය කරනු ලැබුවද එම වාහන අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | යාන්ත්‍රික ඉංජිනේරු දැනුවත් කොට ඇති බව. | ඉතිරි වාහන කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 වාෂරීක ක්‍රියාකාරි සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරි සැලැස්මේ දක්වා තිබුණු විවිධ කර්තව්‍යයන් 08ක් ඉටු කිරීම සඳහා රු.255,024ක මුදලක් වැයකර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කරගෙන නොතිබුණි. | ඉදිරි වර්ෂය තුළ අයවැය ඇස්තමේන්තු මගින් වෙන්කර ඇති මුදල් වලින් ඵලදායී ලෙස කාර්යයන් සිදුකිරීමට පියවර ගන්නා බව. | අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුලදී කර්තව්‍යයන් 30ක් සඳහා රු.2,681,000ක ප්‍රතිපාදන සලසා තිබුණද එම වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගෙන රු.1,209,000ක් වටිනාකම වූ කර්තව්‍යයන් 22ක් අත්හැර දමා තිබුණි. | ඉදිරියේදී ඇස්තමේන්තු සකස් කර ඉදිරි කටයුතු සිදුකරන බව. | ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කර නිමවුම් මට්ටම අත්පත් කර ගැනීමට කටයුතු කල යුතුය. |

**4.2** **තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව ළඟා කරගත යුතු අරමුණු හා ඉලක්ක කරා ළඟා වීම සඳහා සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා තිරසර සංවර්ධන අරමුණු 10ක් සඳහා ඉලක්කයන් 14ක් හඳුනා ගෙන තිබුණි. එම අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම සඳහා වැඩසටහන් 42ක් ක්‍රියාත්මක කර තිබූ අතර එම වැඩසටහන්වලින් වැඩසටහන් 20ක ප්‍රගතිය කරා ළඟා නොවීම සියයට 52 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක පැවතුණි. | වැඩසටහන් ක්‍රියාත්මක කළද එහි ප්‍රගතිය ලඟානොවී ඇති අතර, ඉදිරි වර්ෂයේ ප්‍රගතියක් ලබාගැනීමට අපේක්ෂා කරන බව. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟා වීමට කටයුතු කල යුතුය. |